

# ශාසනයේ උන්නතිය උදෙසා...

ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක අනුශාසක මහා සංඝ සභාවක් කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක කාර්යාලයේ දී පැවැත්විණි. සියම් නිකායේ මල්වතු පාර්ශ්වයේ අනුනායක නියංගොඩ විජිතසිරි හිමියෝ මුලසුන හෙබවූහ.

ජනතාවගේ හා ශාසනයේ උන්නතිය උදෙසා රජය අවධානය යොමු කළ යුතු කරුණු ගණනාවක් සම්බන්ධයෙන් මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි.

නීතිය හා විධි විධාන බල ගැන්වීම, විහාර හා දේවාලගම් පනත, ධර්මාචාර්ය ගුරු පත්වීම් ප්‍රදානය සහ 2600 සම්බුද්ධත්ව ජයන්තියේ ඉදිරි වැඩපිළිවෙළ පිළිබඳව මෙහිදී සාකච්ඡා විය.

කෝට්ටේ පාර්ශ්වයේ අනුනායක ආචාර්ය ඉත්තෑපානේ ධම්මාලංකාර, අමරපුර මහා සංඝ සභාවේ මහා ලේඛකාධිකාරී කොටුගොඩ ධම්මාවාස, කෝට්ටේ ශ්‍රී නාග විහාරාධිපති මාදුළුවාවේ සෝභිත, අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත නිකායේ අනුනායක ඉත්තෑපානේ ධම්මාලංකාර, අධිකරණ සංඝනායක අහංගම ආනන්ද නාහිමිවරු ඇතුළු දිවයිනේ විවිධ පළාත් නියෝජනය කරන මහා සංඝරත්නය මෙම සංඝ සභාවට සහභාගි වූහ. ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ, එම කාර්යාලයේ අධ්‍යක්ෂ ආර්.ඒ.ඩී. සිරිසේන යන මහත්වරු ද මෙම අවස්ථාවට සහභාගි වූහ.

මෙහිදී සාකච්ඡා කළ කරුණු ජනාධිපති ලේකම් කාර්යාලය සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අමාත්‍යාංශ සමග සාකච්ඡා කර නිසි වැඩපිළිවෙළක් සකස් කරන බව මිලින්ද මොරගොඩ මහතා මෙහිදී සඳහන් කළේය.